සිංහල පරිවර්තනය

シンハラ語版

# අන්‍යෝන්‍ය පිළිගැනීම



## රටවල් අතර වෙනස්කම්



## සංස්කෘතීන් අතර වෙනස්කම්

නරිතා නගරය

බහු සංස්කෘතික සහජීවනයට මාර්ගෝපදේශය

# බහු සංස්කෘතික සහජීවනය යනු කුමක්ද?

විවිධ රටවලින් පැමිණි විවිධ ජාතීන්ට අයත් පුද්ගලයින්, එකිනෙකාගේ සංස්කෘතික වෙනස්කම් හඳුනාගෙන, භේදයකින් තොරව සමානාත්මකතාවයෙන්, එකම නරිතා නගරයේ පදිංචිකරුවන් ලෙස එකට ජීවත් වීමයි.




# මාර්ගෝපදේශය පිළිබඳව

නගරය තුළ පදිංචි සියලුම දෙනාට වාසය කිරීමට පහසු නගරයක් නිර්මාණය කිරීම අවශ්‍ය වේ.
අන්‍යෝන්‍ය ලෙස, වෙනස් සංස්කෘතීන් තේරුම් ගන්නා සහ වෙනස් සිතුම් පැතුම් අනුමත කරන සමාජයක් නිර්මාණය කිරීම සඳහා, නරිතා නගරයේ බහු සංස්කෘතික සහජීවනය අරමුණු කොට මෙසේ අදහස් සාරාංශ කළෙමු.

## මූලික සංකල්පය

සෑම පුද්ගලයෙකුම, එකිනෙකාට ගරු කරමින්, විවිධ සිතුම් පැතුම් පිළිගනිමින්,

එක්ව ජීවත් විය හැකි නගරයක්

↓

## මූලික ඉලක්කය

- හැමදෙනාටම එක්ව ජීවත් විය හැකි පරිසරයක් නිර්මාණය කිරීම
- බිය සැකයෙන් තොරව ජීවත් විය හැකි නගරයක් ගොඩනැගීම
- එක් එක් පුද්ගලයාගේ වෙනස්කම් අගය කරන නගරයක් ගොඩනැගීම
- එකිනෙකාගේ යහපත් ගුණාංග උපරිමයෙන් භාවිතා වන නගරයක් ගොඩනැගීම

↓

## උපාය මාර්ග 11 ක සැලැස්ම

# <u>නරිතා නගරයෙහි පදිංචි විදේශිකයන්ගේ තොරතුරු</u>

## ජනගහන වෙනස්වීම

නරිතා නගරයෙහි පදිංචිකරුවන් ලෙස ලියාපදිංචි වූ විදේශිකයන් සංඛ්‍යාව 2017 මාර්තු අවසානයට සාපේක්ෂව, වසර හතරක් තුළ 1,628 කින්, එනම් 38.3% කින් වර්ධනය වී තිබේ.




## රට / කලාපය අනුව ජනගහනය

විදේශිකයන් සංඛ්‍යාව වැඩි වන විට, ඔවුන් අයත් රටවල් සහ කලාප සංඛ්‍යාව ද වැඩි වී ඇත. 2017 මාර්තු අවසානයේ තිබූ රටවල් / කලාප 63 සිට 2021 මාර්තු අවසානයේ රටවල් / කලාප 66 දක්වා වැඩි වී ඇත.



# මාර්ගෝපදේශයේ අන්තර්ගතය

| ඉලක්කය | උපාය මාර්ග සැලැස්ම | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| හැමදෙනාම එකතු වී ජීවත් විය හැකි පරිසරයක් නිර්මාණය කිරීම | ① නගරයේ දැනුම් දීම් සහ ප්‍රයෝජනවත් තොරතුරු විදේශීය භාෂාවලින් නිකුත් කිරීම. උපදේශන සේවා ලබා ගත හැකි ස්ථානයක් සැකසීම. | විදේශිකයන් සඳහා පොදු උපදේශන සේවාවක් ආරම්භ කිරීම. පත්‍රිකා විවිධ රටවල භාෂා වලින් සෑදීම. |
| | ② විදේශීය පදිංචිකරුවන්ට ජපන් භාෂාව තවදුරටත් ඉගෙන ගැනීමට ඉඩ සැලසීම. | විදේශිකයන් සඳහා ජපන් භාෂා පන්ති ආරම්භ කිරීම. |
| | ③ ජපන් සංස්කෘතිය වඩා හොඳින් දැන ගැනීම. | විදේශිකයන් සඳහා ප්‍රයෝජනවත් තොරතුරු සන්නිවේදනය. ඔබේ ස්ථානයට පැමිණ ඉගැන්වීම් / පාඨමාලා ලබාදීම. |
| බිය සැකයෙන් තොරව ජීවත් විය හැකි නගරයක් නිර්මාණය කිරීම | ④ අධ්‍යාපනය සහ ඉගෙනීම කල හැකි පරිසරයක් නිර්මාණය කිරීම. | විදේශීය ශිෂ්‍ය දරුවන් සිටින නිවෙස් වලට ජපන් භාෂා ගුරුවරු යැවීම. ලෝකයේ විවිධ රටවල් ගැන ඉගෙන ගැනීමට පන්ති පැවැත්වීම. |
| | ⑤ බිය සැකයෙන් තොරව රැකියාව කළ හැකි පරිසර නිර්මාණය. | රැකියා සඳහා අවශ්‍ය කුසලතා ඉගැන්වීම. ව්‍යාපාරයක් ආරම්භ කිරීමට කැමති අය සඳහා උපකාර කිරීම. |
| | ⑥ ආපදාවකදී උපකාර කිරීමට යාන්ත්‍රණයක් සෑදීම. | භූමිකම්පා හෝ සුළි කුණාටුවලට මුහුණදීමේ සැලැස්මක් සෑදීම. නගරයෙන් යවන දැනුම්දීමේ ඊමේල් විවිධ රටවල භාෂාවලින් යැවීම. |
| | ⑦ දරුවන් ඇති දැඩි කිරීම, සෞඛ්‍යය, සුබසාධනය සහ වෛද්‍ය සේවාවන් ලබාදීම. | මාතෘ සහ ළමා සෞඛ්‍ය අත්පොත බෙදාහැරීම. දරුවන් ඇති දැඩි කිරීමේදී පැන නගින ගැටළු ආදියට උපදේශන ලබාදීම. |
| | ⑧ නිවසක් සොයා ගැනීමට උදව් කිරීම. | නිවාස සේෆ්ටි නෙට් ක්‍රමය භාවිතා කිරීම. |
| එක් එක් පුද්ගලයාගේ වෙනස්කම් අගය කරන නගරයක් | ⑨ බහු සංස්කෘතික සහජීවනය පිළිබඳ අවබෝධය වැඩිකර, ඒ පරිසරය සකස් කිරීම. | ජාත්‍යන්තර පුරවැසි උළෙලක් පැවැත්වීම. මානව හිමිකම් රැකීම පිළිබඳ අවබෝධය ප්‍රවර්ධනය කිරීම. |
| | ⑩ විදේශිකයන්හට ප්‍රාදේශීය හා සාමාජීය උත්වස ආදී අවස්ථාවන්ට පහසුවෙන් සහභාගී වීම සඳහා අවශ්‍ය සහාය ලබාදීම. | වෙනත් රටවල අය සමඟ ආශ්‍රය සහ රටවල් / කලාපවලින් ඔබ්බට ගොස් අන්‍යෝන්‍ය අවබෝධය වැඩිකිරීම. |
| එකිනෙකාගේ යහපත් ගුණාංග භාවිතා වන | ⑪ විදේශිකයන්ගේ සහායද ගෙන නරිතා නගරයෙහි යහපත් තැන් වර්ධනය කර ගෝලීයකරණයට එකතු වීම. | නරිතා නාමය ප්‍රවර්ධනය කිරීම. විශ්ව සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම. |

ප්‍රකාශනය: නරිතා නගරය

සංස්කරණය: පුරවැසි ජීවිත ශාඛාවේ පුරවැසි සහයෝගිතා අංශය

ලිපිනය: 760, හනසකි-චෝ, නරිතා-ෂි, චිබා 286-8585 දුරකථනය:0476-20-1507

නිකුත් කිරීම: 2021 දෙසැම්බර්

ලියාපදිංචි අංකය: Nari kyo21-049

